# මහනුවර යුගයේ චිත්‍ර කලා සම්ප්‍රදායය සම්භාව්‍ය ගණයට නො වැටෙන පොදු ජන චිත්‍ර කලා සම්ප්‍රදායක් ලෙස හැඳින්වීම යුක්ති සහගත වේ ද ?

එන්. ඩබ්. ඒ. ටී. රිද්මානි
රුහුණ විශ්වවිද්‍යාලය
thamosharidmani90@gmail.com

ශ්‍රී ලංකේය චිත්‍ර කලා ඉතිහාසය තුළ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය හා සාහිත්‍ය මූලාශ්‍රය අතින් දියුණු චිත්‍ර කලාවක් පැවතිබවට සාධක හමු වී ඇත. මෙවන් වූ දියුණු චිත්‍ර කලාවක් පැවතීමෙන් පැහැදිලි වනුයේ ලාංකිකයන් උසස් වූ වින්දන ශක්තියකින් හෙබි පිරිසක් ලෙස කටයුතු කළ බවයි. ලාංකේය ශිල්පීන් තම දක්ෂතා ඔපමට්ටම් කරගනු ලැබුවේ භාරතීය චිත්‍රකලා ශිල්පය අනුසාරයෙනි. ලංකා ඉතිහාසයේ යුග බෙදීම අනුව, මහනුවර රාජධානි සමය ලෙස සැලකෙන්නේ ක්‍රි. ව 1592-1842 දක්වා වූ සියවස් දෙකකට මදක් වැඩි කාල පරිච්ඡේදයකි. මෙම යුගය අන් කවරදාකවත් නොවූ පරිදි දේශපාලන, ආගමික, අධ්‍යාපනික හා සංස්කෘතික පරිහානියක් විද්‍යමාන වූ යුගයක් වශයෙන් හඳුන්වා දිය හැකිය. නැති වී ගිය බෞද්ධ ප්‍රබෝධය නැවත තහවුරු කිරීම සඳහා ප්‍රබල මාධ්‍යයක් ලෙස බෞද්ධ සිතුවම් කලාව භාවිත කර ගන්නට විය. ඒ අනුව මෙම යුගයේ චිත්‍ර නිර්මාණය වී ඇත්තේ බුද්ධි ගෝචර චිත්‍ර ලෙස නොව අක්ෂි ගෝචර චිත්‍ර ලෙසය. ඒ අනුව මහනුවර යුගයේ චිත්‍ර කලා සම්ප්‍රදාය සම්භාව්‍ය ගණයට නො වැටෙන පොදු ජන චිත්‍ර කලා සම්ප්‍රදායක් ලෙස හැඳින්වීම යුක්ති සහගත වේ ද? යන ගැටලුව පාදක කර ගනිමින් මෙම පර්යේෂණය සිදුකරන ලදී. මහනුවර යුගයේ චිත්‍ර කලා සම්ප්‍රදාය සම්භාව්‍ය ගණයට නො වැටෙන පොදු ජන චිත්‍ර කලා සම්ප්‍රදායට අයත් වූවක් ද යන්න විමසා බැලීම මෙම පර්යේෂණයේ මුඛ්‍ය අරමුණවන අතර ඊට අමතරව මෙම චිත්‍ර කලාවට ආවේණික වූ සුවිශේෂී ලක්ෂණ පිළිබඳ විමසා බැලීමත් ඒ පිළිබඳව සමාජයට විධිමත් වූ අවබෝධයක් ලබා දීමත් මෙම පර්යේෂණය තුළින් අපේක්ෂිත අරමුණු ලෙස පෙන්වා දිය හැකිය. මෙම පර්යෙෂණයේ දී ප්‍රධාන වශයෙන් සාහිත්‍ය මූලාශ්‍රය පිළිබඳව පුළුල් අවධානයක් යොමුකරන අතර එසේම මහනුවර සම්ප්‍රදාය නියෝජනය කරන සිතුවම් සමන්විත තෝරාගත් විහාරස්ථාන කිහිපයකම සිතුවම් අධ්‍යයනය කරමින් ක්ෂේත්‍ර අධ්‍යයනයන් ද භාවිත කරමින් මෙම පර්යේෂණය සිදුකරනු ලබයි. මහනුවර යුගය මුල් කරගෙන නිර්මාණය වූ චිත්‍ර සම්ප්‍රදාය මහනුවර යුගයේ චිත්‍ර සම්ප්‍රදාය ලෙස හඳුන්වනු ලබන්නේ සෙසු යුගවලට අයත් බිතුසිතුවම් සමඟ සැසඳීමේ දී මෙම චිත්‍ර සම්ප්‍රදාය තුළ මහනුවර යුගයට ආවේණික වූ ලක්ෂණ රාශියක් පිළිබිඹු කරන බැවිනි. මෙම යුගයේ චිත්‍ර සම්ප්‍රදාය පිළිබඳව විවිධ මත ඉදිරිපත් ව පවතින අතර එහිදී මහාචාර්ය සිරි ගුණසිංහයන් අවධාරණය කරන්නේ මෙම සිතුවම් "ජන චිත්‍ර සම්ප්‍රදායකට" අයත් බවයි.

**ප්‍රමුඛ පද** ඃ මහනුවර; චිත්‍ර කලාව; සුවිශේෂී ලක්ෂණ; පොදු ජන චිත්‍ර